රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
பொது நிருவாக, அனர்த்த முகாமைத்துவ மற்றும் கால்நடை அபிவிருத்தி அமைச்சு
Ministry of Public Administration, Disaster Management and Livestock Development

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන
தொலைபேசி:(94) 011- 2694560
Telephone

ෆැක්ස්
தொலைநகல்:(94) 011- 2692254
Fax

ඊ-මේල්
மின்னஞ்சல்:dgcs@pubad.gov.lk
E-mail

වෙබ් අඩවිය
இணையத்தளம்: www.pubad.gov.lk
Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/A/අන්තර්ග්‍රහණ

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2019.10.23

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/**

**දෙපාර්තමේන්තු ප්‍රධානීන්/**

**දිස්ත්‍රික් ලේකම්වරු/**

**ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**<u>සංවර්ධන නිලධරි III හා II ශ්‍රේණි සඳහා අන්තර්ග්‍රහණය කළ නිලධරයන්ගේ වැටුප් තලයන්හි විෂමතා නිවැරදි කිරීම සම්බන්ධ උපදෙස් ලබා දීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් එක් එක් නිලධාරීන් සඳහා වරින් වර ලිපි නිකුත් කළ නමුදු, 2011.08.01 දිනය සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කළ නිලධාරීන්ගේ වැටුප් තලයන් නිර්ණය කිරීම සහ උසස් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රමයන් අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වන අතරම මේ සම්බන්ධයෙන් වන පොදු උපදෙස් මාලාවක් ඇමුණුම 01 හා ඇමුණුම 02 වශයෙන් මේ සමඟ ඉදිරිපත් කර ඇත.

02. අංක 1774/31 දරණ හා 2012.09.07 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් සංශෝධිත අංක 1745/11 දරණ හා 2012.02.14 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් පළකරන ලද සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 14 ඡේදයේ විධිවිධානවලට අනුකූලව සහ 10/2012 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් ප්‍රකාරව සුදුසුකම් සපුරාලීම මත 2011.08.01 දින සිට බලාත්මක වන පරිදි සංවර්ධන නිලධාරි සේවයේ II හෝ III ශ්‍රේණි සඳහා අන්තර්ග්‍රහණය කිරීම සිදු කරන ලදි.

03. ඒ අනුව 2011.08.01 දිනට **සංවර්ධන නිලධාරි III** ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ නිලධරයකුගේ වැටුප් තලයන් සැකසීම සඳහා උපදෙස් පත්‍රිකාවේ සඳහන් **ඇමුණුම 01** පරිදි සහ 2011.08.01 දිනට **සංවර්ධන නිලධාරි II ශ්‍රේණියට** අන්තර්ග්‍රහණය කළ නිලධරයකුගේ වැටුප් තලයන් සැකසීම සඳහා උපදෙස් පත්‍රිකාවේ සඳහන් **ඇමුණුම 02** පරිදි ක්‍රියා කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**ඇමුණුම 01**

**<u>සංවර්ධන නිලධරි III හා II ශ්‍රේණි සඳහා අන්තර්ග්‍රහණය කළ නිලධරයන්ගේ වැටුප් තලයන්හි විෂමතා නිවැරදි කිරීම සම්බන්ධ උපදෙස් ලබා දීම</u>**

**01. <u>2011.08.01 දිනට සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ නිලධරයකුගේ වැටුප් තලයන් සැකසීම</u>**

1.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) MN 04 – 2006(ඒ) රු. 15,215 – 10 x 215 – 4 x 240 – 7 x 320 – 15 x 360 - රු. 25965 (මාසික) දරන වැටුප් පරිමාණය මෙම තනතුරට හිමි වන අතර ආරම්භක වැටුප් පියවර රු. 15,215 කි.

1.2. දැනටමත් මෙම වැටුප් පරිමාණයේ නියමිත මාසික වැටුප ලබන බැවින් මෙම අන්තර්ග්‍රහණය නිසා වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි කිසිදු වෙනසක් සිදු නොවේ.

1.3. සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ නිලධාරියකු වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය අවසානයේ සාමාන්‍ය කාර්යසාධනය මත II ශ්‍රේණියට උසස් කිරීම සිදු කෙරේ. එහිදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006(IV) අනුව හිමි මාසික වැටුප් පරිමාණය රු.15215-10x215-4x240-7x320-15x360-25965/- කි. සංවර්ධන නිලධාරි II ශ්‍රේණියට හිමි ආරම්භක වැටුප් පියවර රු.17,605කි.

උදා:- 2005.10.14 පත්විම ලද නිලධාරියකු නියමිත සියළු සුදුසුකම් සපුරාලීම මත මත 2011.08.01 දින සිට බලාත්මක වන පරිදි සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන අතර එහිදී ආරම්භක වැටුප් පියවර රු.15,215 කි. සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ 12.1.1. යටතේ එම නිලධාරියා 2015.10.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි සාමාන්‍ය කාර්යසාධනය මත II ශ්‍රේණියට උසස් කිරීම සිදු කෙරේ. එහිදී සංවර්ධන නිලධාරි II ශ්‍රේණියට හිමි ආරම්භක වැටුප් පියවර රු.17,605කි.

**සැ.යු :- නිලධාරියාගේ වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2016.01.01 දින සිට MN 04-2016 - රු. 31490-10x445-11x660-10x730-5x750-54250 අදාළ වැටුප් පරිමාණයෙහි පිහිටුවිය යුතුවේ.**

**ඇමුණුම 02**

**02. <u>2011.08.01 දිනට සංවර්ධන නිලධාරි II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ නිලධරයකුගේ වැටුප් තලයන් සැකසීම</u>**

2.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) MN 04 – 2006(ඒ) රු. 15,215 – 10 x 215 – 4 x 240 – 7 x 320 – 15 x 360 - රු. 25965 (මාසික) දරන වැටුප් පරිමාණය මෙම තනතුරට හිමි වන අතර ආරම්භක වැටුප් පියවර රු. 17,605 කි. 10 වන වැටුප් වර්ධකය උපයා ගැනීමෙන් අනතුරුව 2011.08.01 දින දක්වා MN4-2006(ඒ) වැටුප් පරිමාණයේ II ශ්‍රේණියේ "උසස්වීම් නොලද කාණ්ඩය" යටතේ අදාළ වැටුප් වර්ධක ලබා දීම සිදුකළ යුතුය.

2.2. ඒ අනුව 2011.08.01 දින සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබීමට සුදුසුකම් සපුරා ඇති බැවින් එම උසස් වීම නිලධාරියාට ලබා දී වැටුප් ගෙවීම සිදු කළ යුතු අතර, අදාළ වැටුප් පරිවර්තනය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කළ යුතුය.ඒ අනුව නිලධරයාගේ වැටුප් වර්ධක දිනය අගොස්තු 01 ලෙස සැලකිය යුතු වේ.

2.4. 2018.09.10 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 05/2018 හි 02.2 ප්‍රතිපාදන ප්‍රකාරව I ශ්‍රේණියට උසස් වීමට හිමිකම් ලබන දිනයේදී සුදුසුකම් සපුරා තිබීම මත අදාළ උසස් වීම ලබා දීමට කටයුතු කළ යුතුය.එදින සිට MN4-2006(ඒ) වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් පියවරට හිමිකම් ලබන බැවින් අදාළ වැටුප් නිර්ණය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

උදා:- 01

i. 2000.05.16 දින පත්වීම ලද නිලධාරියකු නියමිත සියළු සුදුසුකම් සපුරාලීම මත 2011.08.01 දින සිට බලාත්මක වන පරිදි සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබයි.

ii. 2010.05.16 වැටුප් වර්ධකය (10 වන) උපයා ගැනීමෙන් අනතුරුව 2011.08.01 දින දක්වා MN4-2006(ඒ) වැටුප් පරිමාණයේ II ශ්‍රේණියේ "උසස්වීම් නොලද කාණ්ඩය" යටතේ අදාළ වැටුප් වර්ධක ලබා දීම සිදුකළ යුතුය.

iii. 2011.08.01 දින සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබීමට සුදුසුකම් සපුරා ඇති බැවින් එම උසස් වීම නිලධාරියාට ලබා දී වැටුප් ගෙවීම සිදු කළ යුතු අතර, අදාළ වැටුප් පරිවර්තනය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කළ යුතුය.ඒ අනුව නිලධරයාගේ වැටුප් වර්ධක දිනය අගොස්තු 01 ලෙස සැලකිය යුතු වේ.

iv. කෙසේ නමුත්, මෙම නිලධාරියාගේ පත්වීම් දිනය 2000.05.16 දින බැවින්, අදාළ සුදුසුකම් සපුරා තිබීම මත 2020.05.16 දිනට I ශ්‍රේණියට උසස් වීමට හිමිකම් ලබනු ඇත.ඒ අනුව,

- I ශ්‍රේණියේ වැටුප් වර්ධක දිනය මැයි 16 වන අතර
- වැටුප් නිර්ණය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කළ යුතුය.

උදා:- 02

i. 1997.05.15 දින පත්වීම ලද නිලධාරියකු නියමිත සියළු සුදුසුකම් සපුරාලීම මත 2011.08.01 දින සිට බලාත්මක වන පරිදි සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබයි.

ii. 2007.05.15 වැටුප් වර්ධකය (10 වන) උපයා ගැනීමෙන් අනතුරුව 2011.08.01 දින දක්වා MN4-2006(ඒ) වැටුප් පරිමාණයේ II ශ්‍රේණියේ "උසස්වීම් නොලද කාණ්ඩය" යටතේ අදාළ වැටුප් වර්ධක ලබා දීම සිදුකළ යුතුය.

iii. 2011.08.01 දින සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබීමට සුදුසුකම් සපුරා ඇති බැවින් එම උසස් වීම නිලධාරියාට ලබා දී වැටුප් ගෙවීම සිදු කළ යුතු අතර, අදාළ වැටුප් පරිවර්තනය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කළ යුතුය.ඒ අනුව නිලධරයාගේ වැටුප් වර්ධක දිනය අගොස්තු 01 ලෙස සැලකිය යුතු වේ.

iv. කෙසේ නමුත්, මෙම නිලධාරියාගේ පත්වීම් දිනය 1997.05.15 දින බැවින්, අදාළ සුදුසුකම් සපුරා තිබීම මත 2017.05.15 දිනට I ශ්‍රේණියට උසස් වීමට හිමිකම් ලබනු ඇත.ඒ අනුව,
   - I ශ්‍රේණියේ වැටුප් වර්ධක දිනය මැයි 15 වන අතර
   - වැටුප් නිර්ණය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කළ යුතුය.

**සැ.යු :- නිලධාරියාගේ වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2016.01.01 දින සිට MN 04-2016 - රු. 31490-10x445-11x660-10x730-5x750-54250 අදාළ වැටුප් පරිමාණයෙහි පිහිටුවිය යුතුවේ.**